# ශ්‍රී ලංකාවේ කනිෂ්ඨ ද්විතියික මට්ටමේ ශිෂ්‍ය ඇගයීම සඳහා සම්භවන ඇගයීම යොදාගැනීමේ ප්‍රයත්නයන්හි සාර්ථකත්වය අධ්‍යයනය කිරීම

## (හික්කඩුව අධ්‍යාපන කොට්ඨාශය ඇසුරින්)

ඩබ්ලිව්. ඩබ්ලිව්. තිලකා

**B.A, Dip in Ed., M.Ed**

**(University of Colombo)**

UCLIB
532623

කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන දර්ශනපති උපාධිය
සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධය

**2000 M.Phil /11**

**2004**

# සංක්ෂේපය

අධ්‍යාපනික ඇගයීම්වලදී ලෝකයේ බොහෝ රටවල් සම්භවන ඇගයීම මත විශ්වාසය තබා ඇති අතර බහුවිධ ඇගයීම් ක්‍රම භාවිතා කෙරේ. මේ අනුව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සහ ශිෂ්‍ය ඇගයීම් ක්‍රමයේ සුසමාදර්ශී විතැන්වීමක් සිදු වී ඇත. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී ඉගෙනීම, පෙළඹවීම, මඟපෙන්වීම යන සංකල්ප වැදගත් වී ඇති අතර තක්සේරු ක්‍රියාවලිය මගින් එය වඩාත් අර්ථවත් හා ඵලදායී වන බව අනාවරණය වී ඇත.

ශ්‍රී ලංකාව ප්‍රථම වරට සම්භවන ඇගයීම් ක්‍රියාවලිය 'අඛණ්ඩ ඇගයීම් ' නමින් 1988 දී පාසල් පද්ධතියට හඳුන්වා දෙනු ලැබුව ද, එහි පැවැත්ම තාවකාලික විය. සංකල්පය, අරමුණු සහ ස්වරූපය සුභවාදී වුවද, ක්‍රියාත්මක තලයේ මතු වූ ගැටළු නිසා අඛණ්ඩ ඇගයීම් ක්‍රමය අත්හිටුවන ලදී.

1999 දී පාසල් පාදක ඇගයීම් ක්‍රමය නමින් ශිෂ්‍ය ඇගයීම් ක්‍රමය නව මුහුණුවරකින් නැවත හඳුන්වා දී දැනට පාසල් පද්ධතියේ ක්‍රියාත්මක වෙමින් පවතී. ඒ අනුව මෙම අධ්‍යයනය මගින් කනිෂ්ඨ ද්විතියික මට්ටමේ පාසල්වල එහි සංකල්පමය පදනම, ප්‍රායෝගික කරණයේ දී අභිමතාර්ථ සහ අරමුණු කෙතෙක් දුරට සාර්ථක වන්නේදැයි පුළුල් ලෙස අධ්‍යයනය කරන ලදී.

සම්භවන ඇගයීම් සංකල්පය අධ්‍යයනය කිරීමත්, සම්භවන ඇගයීම් ක්‍රමය ශ්‍රී ලංකා පාසල් පද්ධතිය තුළට හඳුන්වා දුන් විවිධ අවස්ථාවන්හි සාර්ථකත්වය පිළිබඳව තොරතුරු වාර්තා ඉදිරිපත් කිරීමත්, වර්තමාන පාසල් පද්ධතිය තුළ එම ඇගයීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක වන ආකාරය අධ්‍යයනය කිරීමත්, ඒ පිළිබඳව පාසල් ප්‍රජාව දරන ආකල්ප විමසා බැලීමත්, මෙම ඇගයීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන ගැටළු හා බාධක අධ්‍යයනය කර ඒ සඳහා විසඳුම් හා යෝජනා ඉදිරිපත් කිරීමත් මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණු වේ.

හික්කඩුව අධ්‍යාපන කොට්ඨාශයේ නවවන ශ්‍රේණියේ සමාජ අධ්‍යයනය විෂයය කෙරෙහි සුවිශේෂකරණය කොට මෙම අධ්‍යයනය කරන ලදී. මෙම අධ්‍යයනය සඳහා කනිෂ්ඨ ද්විතියික ශ්‍රේණි පැවැත්වෙන පාසල් 30 අතරින් පාසල් 15 ක අහඹු ලෙස තෝරාගත් සිසුන්

120 ක්, සහ ඔවුන්ගේ දෙමාපියන්, ගුරුවරු 36 ක්, විදුහල්පතිවරු 15 ක්, ගුරු උපදේශකවරු සහ අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත නියැදියක් යොදා ගන්නා ලදී.

ආකල්ප පරීක්ෂණ, විවෘත ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා පැවැත්වීම සහ ඉගෙනුම් අවස්ථා, සිසු නිර්මාණ, ශිෂ්‍ය සාධන වාර්තා සහ ශිෂ්‍ය ඇගයීම් ආශ්‍රිත ලිපිගොනු නිරීක්ෂණය මගින් ලබාගත් දත්ත ලයිකට් පරිමාණය අනුව විශ්ලේෂණය කරන ලදී.

මෙම අධ්‍යයනයෙන් එළඹි නිගමන කිහිපයකි.

1. දැනුම, කුසලතා, ආකල්ප වර්ධනය කරමින් ශිෂ්‍ය සාධනය ප්‍රගුණ කෙරෙන, කණ්ඩායම් ක්‍රියාකාරකම් කෙරෙහි ප්‍රමුඛත්වයක් ලබා දෙමින් ඉගෙනුම් සංවර්ධනය කෙරෙහි ඉහළ දායකත්වයක් මෙම ශිෂ්‍ය ඇගයීම් ක්‍රමය මගින් සැපයේ.
2. වාරාන්ත පරීක්ෂණවල අවශ්‍යතාව තවදුරටත් ඉස්මතු වී ඇත.
3. නායකත්ව ගුණාංග වර්ධනය කරමින් ශිෂ්‍ය පෞරුෂ සංවර්ධනය කෙරෙහි සපයන දායකත්වය සතුටුදායක මට්ටමක පවතී.
4. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සංවර්ධනය යම්තාක් දුරකට සාර්ථක වුවද සතුටුදායක මට්ටමක නැත.
5. ගුරු කාර්යභාරය අතිශය වැඩි වී ඇති අතර සම්ප්‍රදායික ස්වරූපයේ ලිඛිත ඇගයීම් කෙරෙහි ගුරුවරු තවදුරටත් නැඹුරු වී සිටිති.
6. මෙම ශිෂ්‍ය ඇගයීම් ක්‍රියාවලිය පිළිබඳ ගුරුවරු සතු දැනුවත්භාවය ප්‍රමාණවත් නැත. ක්‍රමානුකූල නැත. මේ සඳහා පැවැත්වෙන සැසි සහභාගිත්වය ද සතුටුදායක නැත.
7. මෙම ශිෂ්‍ය ඇගයීම් ක්‍රියාවලිය පිළිබඳව කෙරෙන අධීක්ෂණය හා මෙහෙයවීමේ පුළුල් ක්‍රියාදාමය පිළිබඳව ගුරුවරු තුළ ප්‍රසාදයක් ඇතත් එය නිසිලෙස සිදුවන්නේ නැත.
8. ඇගයීම් සඳහා ඇති ජාතික මට්ටමේ පිළිගැනීම කොහෙත්ම ප්‍රමාණවත් නොවන අතර එහි අවශ්‍යතාවය දැඩිලෙස ඉස්මතු වී ඇත.

ඉහත නිගමන වලින් දක්වෙන පරිදි සම්භවන ඇගයීම් ක්‍රියාවලියක් වශයෙන් පාසල් පාදක ඇගයීම් ක්‍රියාවලියේ සංවර්ධනය උදෙසා ඇතැම් ක්ෂෙත්‍ර සංස්කරණය කළ යුතුව ඇත. ඒ සඳහා වඩාත් යෝග්‍ය යෝජනා මාලාවක් ද ඉදිරිපත් කර ඇත.